# AIA ඊසි පෙන්ෂන්ස් ප්ලස්

## ටක් ටික් ටුක් තරම්ම ලේසියි!



AIA ඉන්ෂුවරන්ස්

HEALTHIER, LONGER, BETTER LIVES

# ඔබ කැමති උනත් නැතත්, අපට විශ්‍රාමයට මුහුණ දීමට සිදු වෙනවා.

අපි හැමෝම අපේ ජීවිත කාලයෙන් අවුරුදු 40ක් පමණ ගත කරන්නේ වැඩ කරමින්. සමහරු රැකියාවල නිරත වන අතර තවත් සමහරු තමන්ගේම ව්‍යාපාරයක් කරගෙන යනවා. මේ අවුරුදු 40ක අපේ රැකියා ජීවිතය තුළ අපි කායිකව ශක්තිමත්ව, සතුටින් ඉන්නේ අපිට ආදායමක් උපයාගන්න පුළුවන් නිසා. විශ්‍රාම ජීවිතයත් ඒ අයුරින්ම ගත කිරීම තමයි අපේ සිහිනය.

## විශ්‍රාමය ගැන සිතන්නට ජීවිතයේ සැඳෑ සමය එළැඹෙන තුරුම සිටීම නුවණට හුරු නැහැ.





**විශ්‍රාමය පිළිබඳව සිතන්නට පටන් ගන්නේ මේ අවස්ථාවේ නම් ඔබ ප්‍රමාද වුණා වැඩියි**

**රැකියාවේ ආරම්භය**

**විශ්‍රාමය**

**රැකියා දිවිය** — වසර 40

**විශ්‍රාම දිවිය** — වසර 17




**වයස අවු. 20**

**වයස අවු. 60**

**වයස අවු. 77**

2021 වසරේදී අපේක්ෂිත ආයු කාලය

**ඔබගේ ජීවිතයේ මේ අවධිය ශක්තියෙන් සහ සතුටින් පිරී ගිය කාලයක්**

**විශ්‍රාම ජීවිතයත් ඒ අයුරින්ම ගත කිරීම ඔබගේ අපේක්ෂාවයි**






නමුත්, ශ්‍රී ලංකාව තුළ විශ්‍රාමය පිළිබඳ යතාර්ථය එතරම් යහපත් නොවේ. සංඛ්‍යාලේඛන පෙන්වා දෙන්නේ ශ්‍රී ලාංකිකයන් විශ්‍රාම ගැනීම සඳහා නිසි සූදානමක් නොමැති බවයි.

| | |
|---|---|
| 54 | රටවල් 73ක් අතරින් සුවපහසු විශ්‍රාමය ශ්‍රේණිගත කිරීමේ දර්ශකයේ (Comfortable Retirement Ranking Index) ශ්‍රී ලංකාවට හිමිව ඇත්තේ 54වන ස්ථානයයි. |
| 50% | 50%කට ආසන්න විශ්‍රාමිකයින් පිරිසකට විශ්‍රාම ආදායමක් නොලැබේ. |
| 85% | වයස අවු 20-59 අතර ජනගහනයෙන් 85%කට විශ්‍රාම ක්‍රමයක් යටතේ ආවරණයක් නොමැත (පුද්ගලික ක්ෂේත්‍රයේ). |
| 19% | රැකියා කරන ජනගහනයෙන් 19%ක් පමණක් රජයේ විශ්‍රාම ක්‍රමයකින් ආවරණය වේ. |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව/ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ https//www.usnews.com/news/best-countries/best-countries-to-retire

## AIA ඊසි පෙන්ෂන්ස් ප්ලස් ඔබ වෙනුවෙන්ම පෙර පැකේජ ලෙස සකසා ඇත. ඉතින්, ඔබ කලයුත්තේ ඉන් ඔබට ගැළපෙන පැකේජය තෝරා ගැනීම පමණි.

| ප්‍රතිලාභ (රු.) | පැකේජය 1 | පැකේජය 2 | පැකේජය 3 | පැකේජය 4 | පැකේජය 5 | පැකේජය 6 |
|---|---|---|---|---|---|---|
| ජීවිත ප්‍රතිලාභය | 450,000 | 600,000 | 750,000 | 900,000 | 1,050,000 | 1,200,000 |
| හදිසි අනතුරු ප්‍රතිලාභය | 675,000 | 900,000 | 1,125,000 | 1,350,000 | 1,575,000 | 1,800,000 |
| වාරික ආරක්ෂණ ප්‍රතිලාභය | ඔව් | ඔව් | ඔව් | ඔව් | ඔව් | ඔව් |
| අසාධ්‍ය රෝග ප්‍රතිලාභය* | 100,000 | 200,000 | 300,000 | 400,000 | 500,000 | 600,000 |
| රෝහල් ගතවීමේ ප්‍රතිලාභය* | 1,000 | 2,000 | 3,000 | 4,000 | 5,000 | 6,000 |

| | |
|---|---|
| ඔප්පු කාල සීමාවන් | වසර 15, 20, 25 සහ 30 |
| විශ්‍රාම ආදායම් කාල සීමාව | වසර 5 - 30 දක්වා |

*මෙම ප්‍රතිලාභ කැමති නම් පමණක් තෝරාගැනීමේ හැකියාව ඔබට ඇත.

## ඔබේ විශ්‍රාම දිවිය AIA ඉන්ෂුවරන්ස් සමඟින් අදම සැලසුම් කරන්න. AIA ඊසි පෙන්ෂන්ස් ප්ලස් ඔස්සේ, පහසු පියවර 3කින් ඔබට විසඳුම්!

### ටක්!
ඔබට අවශ්‍ය පැකේජය තෝරාගන්න

AIA ඊසි පෙන්ෂන්ස් ප්ලස් වෙතින් ඔබට තෝරාගැනීමට පැකේජ 6ක්.

සෑම පැකේජයකම ජීවිත ප්‍රතිලාභයක්, හදිසි අනතුරු ප්‍රතිලාභයක් සහ වාරික ආරක්ෂණ ප්‍රතිලාභයක් අන්තර්ගත වේ.

රෝහල් ගතවීමේ ප්‍රතිලාභය සහ අසාධ්‍ය රෝග ප්‍රතිලාභය අමතර ප්‍රතිලාභ ලෙස ඔබට තෝරාගත හැක.

### ටික්!
වාරික ගෙවීමට කැමති කාල සීමාව තෝරාගන්න

මෙම කාල සීමාව අතරතුර ඔබගේ විශ්‍රාම අරමුදල වර්ධනය වන අතර ඔබට මූල්‍ය රැකවරණයද ලැබෙනු ඇත.

ඔබ වාරික ගෙවීමට කැමති කාල සීමාව තෝරාගන්න:

- වසර 15
- වසර 20
- වසර 25
- වසර 30

### ටුක්!
ඔබ ලබා ගැනීමට කැමති එකවර මුදලක්ද නැතහොත් මාසික විශ්‍රාම ආදායමක්ද යන්න තීරණය කරන්න

ඔබට විශ්‍රාම අරමුදල එකවර මුළු මුදලක් ලෙස හෝ වර්ධනය වන මාසික විශ්‍රාම ආදායමක් ලෙස වසර 5-30 දක්වා කාල සීමාවකට ලබාගත හැකිය.

- ඔප්පුව කල්පිරීමේදී විශ්‍රාම අරමුදල එකවර මුළු මුදලක් ලෙස.
- වසර --- සඳහා වර්ධනය වන මාසික විශ්‍රාම ආදායමක් ලෙස.

# AIA ඊසි පෙන්ෂන්ස් ප්ලස් ප්‍රතිලාභ සැකෙවින්

- ඔබ වියෝවුවහොත් ඔබේ පවුලට ජීවිත ප්‍රතිලාභයක්
- ලෝයල්ටි දීමනා සමඟින් ඔබේ විශ්‍රාම අරමුදලට ආකර්ෂණීය වර්ධනයක්
- හදිසි අවස්ථාවක දී අරමුදලෙන් 15%ක් දක්වා ආපසු ලබා ගැනීමේ හැකියාව
- විශ්‍රාම අරමුදල එකවර මුදලක් හෝ මාසික ආදායමක් ලෙස
- ඔබට හදිසි අනතුරු ප්‍රතිලාභයක්
- වාරික ගෙවීමේ මාදිලි: වාර්ෂික, අර්ධ වාර්ෂික, ත්‍රෛමාසික සහ මාසික
- පෙන්ෂන්ස් වර්ධකයක්: වර්ධනය වන මාසික විශ්‍රාම ආදායමක්
- ඔබ වියෝවුවහොත් හෝ නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට පත්වුවහොත් වාරික ආරක්ෂණ ප්‍රතිලාභය සමඟින් අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාම
- හදිසි අනතුරක් හෝ අසනීපයක් හේතුවෙන් නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයක් සිදුවුවහොත් ප්‍රතිලාභ

## අමතර ප්‍රතිලාභ

- රෝහල් ගතවීමේ ප්‍රතිලාභය
- අසාධ්‍ය රෝග ප්‍රතිලාභය

# සැලසුමට අදාළ වැදගත් විශේෂාංග




## ලෝයල්ටි දීමනා


ඔබට විශාල විශ්‍රාම අරමුදලක් ලබා දීම සඳහා ඔබේ වාර්ෂික මූලික වාරිකයෙන් 8 ගුණයක් (800%) දක්වා ලෝයල්ටි දීමනා ගෙවනු ලබයි.





## පෙන්ෂන්ස් වර්ධකය

ඔබගේ විශ්‍රාම අරමුදල එකවර මුදලක් ලෙස හෝ වසර 5 සිට 30 දක්වා කාලයක් පුරාවට මාසික විශ්‍රාම ආදායමක් ලෙස ලබා ගැනීමට ද හැකිය. ඔප්පුව කල්පිරීමේ දී ඔබ මාසික විශ්‍රාම ආදායම් විකල්පය තෝරා ගන්නේ නම්, පෙන්ෂන්ස් වර්ධක විශේෂාංගය ඔස්සේ වාර්ෂික ලාභාංශ ප්‍රතිශතය 30%කින් වැඩිවී ඔබගේ මාසික විශ්‍රාම ආදායම වර්ධනය කරනු ඇත. මෙය ඔබගේ විශ්‍රාම කාලය තුළ වර්ධනය වන මාසික විශ්‍රාම වැටුපක් ලැබීම සහතික කරයි.




## හදිසි අවශ්‍යතාවයක් සඳහා මුදල් ආපසු ගැනීමේ හැකියාව

පළමු ඔප්පු වර්ෂ තුන අවසාන වූ පසු ඕනෑම අවස්ථාවක දී අරමුදලේ අගයෙන් 15%ක් දක්වා ආපසු ලබාගැනීමේ හැකියාව ඔබට ඇත. මෙම පහසුකම ලබා දී ඇත්තේ ජීවිතයේ අපට මුහුණ දීමට සිදුවිය හැකි බලාපොරොත්තු නොවන අවස්ථා සැලකිල්ලට ගැනීමෙනි. මෙම පහසුකම ලබාගත හැකිවන්නේ ඔප්පු කාල සීමාව අතරතුර එක් වරක් පමණි.

| | |
|---|---|
| **ඇතුළත් වීමේ වයස** | අවුරුදු 19 - 61 (ඊළඟ උපන්දිනය වන විට) |
| **උපරිම කල්පිරීමේ වයස** | අවුරුදු 76 (ඊළඟ උපන්දිනය වන විට) |

**උදාහරණ**

අමල්ගේ වයස අවුරුදු 30කි (ඊළඟ උපන් දිනයට). ඔහු විවාහකයෙක් වන අතර ඔහුට දරුවන් දෙදෙනෙකු සිටියි. ඔහු පහත සඳහන් ප්‍රතිලාභ සමඟින් AIA ඊසි පෙන්ෂන්ස් ප්ලස් (පැකේජය 3) මිලදී ගනියි.



| | |
|---|---|
| ජීවිත ප්‍රතිලාභය - **රු. 750,000** | හදිසි අනතුරු ප්‍රතිලාභය - **රු. 1,125,000** |
| ඔප්පු කාල සීමාව - **වසර 25** | වාරික ගෙවීමේ මාදිලිය - **වාර්ෂික** |
| මුළු වාර්ෂික වාරිකය - රු. 40,403 | |

## අමල්ට විශ්‍රාම අරමුදල ලබා ගැනීමට ඇති විකල්ප

අමල්ට විශ්‍රාම අරමුදල එකවර මුදලක් ලෙස ලබා ගැනීමට අවශ්‍ය නම්, ඔප්පු කාල සීමාව අවසානයේ නිදර්ශිත විශ්‍රාම අරමුදල:

| **අරමුදලේ තොරතුරු** | **උපකල්පිත ලාභාංශ අනුපාත** | | |
|---|---|---|---|
| | 4% වාර්ෂිකව | 8% වාර්ෂිකව | 10% වාර්ෂිකව |
| නිදර්ශිත විශ්‍රාම අරමුදල (රු.) | 1,242,444 | 2,044,662 | 2,675,379 |

**ඉහත විශ්‍රාම අරමුදල, අමල්ගේ වාර්ෂික මූලික වාරිකය මෙන් 8 ගුණයකට සමාන ලෝයල්ටි දීමනාවකින් සමන්විත වේ.**

අමල්ට ඔහුගේ විශ්‍රාම අරමුදල මාසික විශ්‍රාම ආදායමක් ලෙස වසර 15ක කාල සීමාවක් සඳහා ලබා ගැනීමට අවශ්‍ය නම්, නිදර්ශිත මාසික විශ්‍රාම ආදායම පහත පරිදි වනු ඇත.

| **නිදර්ශිත මාසික විශ්‍රාම ආදායම (රු.)** | **උපකල්පිත ලාභාංශ අනුපාත** | | |
|---|---|---|---|
| | 4% වාර්ෂිකව | 8% වාර්ෂිකව | 10% වාර්ෂිකව |
| **පෙන්ෂන්ස් වර්ධකය සමඟින් නිදර්ශිත වාර්ෂික ලාභාංශ අනුපාත** | 5.2% වාර්ෂිකව | 10.4% වාර්ෂිකව | 13% වාර්ෂිකව |
| වයස අවුරුදු 56 දී | 7,210 | 12,455 | 16,684 |
| වයස අවුරුදු 61 දී | 8,963 | 19,742 | 29,732 |
| වයස අවුරුදු 66 දී | 11,143 | 31,293 | 52,986 |
| විශ්‍රාම ආදායම් ලැබීමේ කාල සීමාව තුළදී ලැබෙන මුළු විශ්‍රාම ආදායම් වටිනාකම | 1,749,818 | 4,395,803 | 7,157,479 |

## අමල්ට ලැබෙන රැකවරණ ප්‍රතිලාභ

10 වන ඔප්පු වර්ෂයේ දී අමල් අවාසනාවන්ත ලෙස හදිසි අනතුරකින් වියෝවුවහොත්, ඔහුගේ ආදරණීයයන්හට පහත සඳහන් රැකවරණ ප්‍රතිලාභ හිමිවෙනු ඇත.




ජීවිත ප්‍රතිලාභය ලෙස රු. 750,000ක මුදලක් අමල්ගේ ආදරණීයයන්හට ලබාදෙනු ඇත.



හදිසි අනතුරු ප්‍රතිලාභය ලෙස රු. 1,125,000ක මුදලක් අමල්ගේ ආදරණීයයන්හට ජීවිත ප්‍රතිලාභයට අමතරව ලබාදෙනු ඇත.




වාරික ආරක්ෂණ ප්‍රතිලාභය - AIA විසින් අමල් වෙනුවෙන් වාරික ගෙවා ඔහුගේ රක්ෂණ ඔප්පුව ඉදිරියට පවත්වාගෙන යනු ඇත.




ඔප්පු කාල සීමාව අවසානයේ දී අමල්ගේ පවුලේ අයට විශ්‍රාම අරමුදල ලැබෙනු ඇත. කල්පිරීමේ දී එකවර මුදලක් ලෙස හෝ මාසික ආදායමක් ලෙස හෝ දෙකෙහිම එකතුවක් ලෙස එම අරමුදල ලබා ගැනීමේ නම්‍යශීලීතාවයද ඔවුන්ට ලැබෙනු ඇත.

### නියමයන් සහ කොන්දේසි

මෙම සැලසුම ලබා ගත හැක්කේ AIA වෙල්ත් ප්ලෑනර්වරයෙකු, AIA මූල්‍ය සැලසුම් විධායකවරයෙකු හෝ බලයලත් තැරැව්කරුවෙකුගෙන් පමණි.

ඕනෑම රක්ෂණ සමාගමක් සහ / හෝ ඕනෑම රක්ෂණ සැලසුමක් තෝරා ගැනීමේ අයිතිය ඔබ සතු වේ. තවද බැංකුවක් හෝ වෙනත් ඕනෑම ආයතනයක් විසින් තම මූල්‍ය සේවාවන් තුළ අන්තර්ගත කර ඇති හෝ බැඳී ඇති ඕනෑම රක්ෂණ සැලසුමක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතියද ඔබ සතුවේ.

මෙය සැලසුමේ දළ විශ්ලේෂණයක් පමණි. නියමයන් සහ කොන්දේසි අදාළ වේ. සම්පූර්ණ සැලසුමේ විස්තර, නියමයන් සහ කොන්දේසි සඳහා කරුණාකර රක්ෂණ ඔප්පුව බලන්න. ඔබේ යෝජනා පත්‍රයට අත්සන් කිරීමට පෙර ඔබට විකුණුම් නිදර්ශනයක් - මිල කැඳවුමක් ලබා දෙනු ඇති අතර එමඟින් සැලසුමේ විශේෂාංග සහ ආවරණයන් තවදුරටත් විස්තර කෙරේ.

ජීවිත රක්ෂිතයා රක්ෂණාවර හිමියා නොවන්නේ නම් මෙම රක්ෂණාවරය මඟින් සපයනු ලබන ප්‍රතිලාභ රක්ෂණාවර හිමියා වෙත අදාළ වන අතර ආවරණයන් ජීවිත රක්ෂිතයා වෙත අදාළ වේ.

EP - 300000405
V1 - 12/20

AIA Insurance Lanka Limited (Co.No.PQ 18 PB) විසින් නිකුත් කරන ලදී. 12/20/2021

HEALTHIER, LONGER,
BETTER LIVES

AIA විසින් අලෙවි කරන සෑම ඔප්පුවක් සඳහාම රු.100 ක්
ශ්‍රී ලංකා පිළිකා සංගමයට පරිත්‍යාග කිරීමට පොරොන්දු වෙයි.